VERITÉ
විදසුන්

Originally Published in: [Mawbima, May, 2015]

## යහපාලනය දේශපාලකයන් සඳහා පමණක් නොවෙයි; දුම්වැටි බදුකරණයට නතු කිරීම

දුම්වැටි සහ මධ්‍යසාර නිෂ්පාදන වෙනුවෙන් අයකරගන්නා සුරා බදු රජයේ ආදායමේ කැපී පෙනෙන මූලාශ්‍රයකි. බදුකරණය පිළිබඳ තීරණයට තාක්ෂණික ඇගයීමක් අවශ්‍යවන අතර එය ශ්‍රී ලංකා නිල තන්ත්‍රය මත රඳා පවතින්නකි.

මෙම විග්‍රහය මගින් නිලධාරීන්ගේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් රජයට සිදුවූ පාඩුව ගවේෂණය කරනු ලැබෙයි. පැවති ආසන්නතම දත්ත වලින් හෙළිවන ආකාරයට දුම්වැටි බදුකරණයට අදාලව නිලධාරීන්ගේ වැරදි ක්‍රියා කලාප හේතුවෙන් පසුගිය වසර අට තුළ ශ්‍රී ලංකා රජයට බිලියන 76 ක පාඩුවක් සිදු විය.

### දුම්වැටි බදුකරණයට නතු කිරීමට ඇති අවකාශය

දුම්වැටි සඳහා අය කරනු ලබන සුරා බද්දෙන් ශ්‍රී ලංකාව වසරකට බිලියන 60ක ආදායමක් ලබයි. සුරා බද්ද ශත 25 සිට 30 දක්වා ප්‍රමාණයකින් වැඩි කිරීම මගින් ආදායම රුපියල් බිලියනයකින් පමණ වැඩිකරගත හැකි වෙයි. එම නිසා ක්‍රමවත් බදු නියම කිරීම රජයට විශාල වාසියක් වනු ඇත.

දුම්වැටියක නිෂ්පාදන වියදම - 80% කට අධික වෙළඳපොල කොටස් සහිත වෙළඳ සන්නාමය සැළකුවහොත් - සිල්ලර මිලෙන් 5% කට වඩා අඩු වෙයි. මෙමගින් බදුකරණය සඳහා විශාල අවකාශයක් ලබා දෙයි. 1990 ගණන් වලදී සහ මතට තිත වැඩසටහන ක්‍රියාත්මක වූ මුල් වර්ෂ වලදී (2006 වර්ෂයේදී) ශ්‍රී ලංකාව තුළ දුම්වැටි සඳහා අයකරනලද සුරා බද්ද 65-72% අතර පරාසයක පැවතුණි. මීට අමතරව, රජය මගින් අගය එකතු කරන ලද බද්ද (වැට්) වැනි සාමාන්‍ය බදුද දුම්වැටි මත පනවනු ලබයි.

2006 වර්ෂයේදී වඩාත් ජනප්‍රිය වෙළඳ සන්නාමය සඳහා අයකරන ලද 70.8% ක් වූ බද්ද, 2008 වර්ෂයේ සැප්තැම්බරයේදී, වර්තාගතවී ඇති අවමය වන 55.3% දක්වා අඩුවිය. 2011 වර්ෂයේදී එය 61% දක්වා වර්ධනය වූ අතර, 2012 වර්ෂයේදී 59% දක්වා අඩු වීම එලෙසින්ම පවතියි.

### වසර අටකට පසු සිදුවූ හදිසි බදුකරණ නිවැරදි කිරීම

2014 වර්ෂයේ ඔක්තෝබර් 14 වන දින ශ්‍රී ලංකා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය මගින් ක්ෂණිකව සුරා බදු අනුපාතය 2006 වර්ෂයේ තිබූ මට්ටමට එනම් 72% දක්වා වැඩි කරන ලදි. මෙය සිදු වූයේ වසර අටක ප්‍රමාදයකින් පසුවය. දුම්වැටි **නිෂ්පාදන සමගම** මෙම බදු වැඩිකිරීමට ප්‍රතිචාරයක් ලෙස මිල වැඩි

කිරීම් සිදුකළේ නැත. 2002 වර්ෂයේ සිට, දුම්වැටි මිලට වඩා වැඩිවන මිලදී ගැනීමේ හැකියාව (ඒක පුද්ගල ආදායම) පිළිබඳ වෙනස නොසළකා, 72% ක් වූ මෙම වැඩි කිරීම සිදු කරන ලදි.


## වසර අටක් පුරාවට සිදුවන නොසළකා හැරීමේ පාඩුව

වසර අටක් පුරා නොසළකා හැරීමේ පාඩුව පසුගිය වසර අටක කාලය තුළ දැනට පවතින සහ පූර්වයේ පැවති 70+% ක ප්‍රමාණයට වඩා බදු අඩුවීම ක්‍රමිකවත් සහ කැපිපෙනෙන ලෙසත් සිදුවිය. 2014 ඔක්තෝබර් 24 වන දින සිදුකරන ලද ක්ෂණික නිවැරදි කිරීම් මගින් පෙනී යන්නේ, ස්වාධීන සංවිධානවලින් මේ සම්බන්ධව සිදු කරන ලද ලිවීම් සහ පර්යේෂණ වල බලපෑමක් ඒ සඳහා එල්ල වූ බවයි. සියලු ආකාර දුම්වැටි සඳහා මෙම තත්වය බලපානු ලබන ආකාරය පළමු ප්‍රදර්ශකය මගින් පෙන්වනු ලබයි.

පළමු ප්‍රදර්ශකය මගින් පෙන්වනු ලබන්නේ, සුරා බද්ද 70+% ලෙස දැනට පවතින ප්‍රමාණයෙන් පසුගිය වසර අට තුළ පැවතුණේ නම්, රජයට ඒ මගින් වාර්ෂිකව ලැබීමට තිබූ ආදායමයි. මෙමගින් පූර්ණ වශයෙන් රුපියල් බිලියන 76 ක ආදායමක් රජයේ අදායමට එකතු කරනු ලබන්නේ හෝ වසරකට රුපියල් බිලියන 9.5 ක් පමණ ආදායමක් එකතු කිරීමේ හැකියාව තිබුණි. (කෙසේවෙතත්, රජයට අහිමි වූ මෙම ආදායමින් කොටසක් නීති ප්‍රකාර ව්‍යාපාරික බදු මගින් නැවත රජයට ලැබෙන්නට සලස්වනු ඇත).

### පළමු ප්‍රදර්ශකයː නිලධාරීන්ගේ නිර්වෘත්තික භාවය හේතුවෙන් 2007 වර්ෂයේ සිට සිදු වූ පාඩුව

රු.මිලියන





දිගින් මි.මී.
60 ක් නොඉක්මවන දුම්වැටි
**දිගින් මි.මී. 60 ක් ඉක්මවන නමුත් මි.මී. 67 ක් නොඉක්මවන** දුම්වැටි
**දිගින් මි.මී. 67 ක් ඉක්මවන නමුත් මි.මී. 72 ක් නොඉක්මවන** දුම්වැටි
**දිගින් මි.මී. 72 ක් ඉක්මවන නමුත් මි.මී. 84 ක් නොඉක්මවන** දුම්වැටි

මූලාශ්‍රයː ජාතික අන්තරායකර ඖෂධ පාලක සභාව මගින් නිකුත් කරනලද ඖෂධ තොරතුරු වාර්තා (වසර කිහිපයකට අදාළව) මගින් අදායම සහ දුම්වැටි පරිභෝජන විස්තරත්, ගැසට් පත්‍රයෙහි පළවූ බදු අනුපාතත් මත පදනම්ව ගණනය කිරීම් සිදුකර ඇත. සටහන්ː 1.2012 - 2013 වසර දක්වා සිදුවූ පරිභෝජන රටා වෙනස්වීමට සමාන ලෙස 2014 වර්ෂය සඳහා පරිභෝජනය ඇස්තමේන්තුකර ඇත, 2. මි.මී. 67 සහ මි.මී. 72 අතර දිගකින් යුතු සිගරට් මිල සඳහා 2007 වර්ෂය වෙනුවෙන් බදුවල සමාන වැඩි වීමක් උපකල්පනය කරමින් ඇස්තමේන්තු කර ඇත, 3. 2006 සිට 2009 වර්ෂය දක්වා මි.මී. 60 නොඉක්මවන සිගරට් සඳහා බඳු සැකසීම පිළිබඳ ගැසට් තොරතුරු හිඟකම හේතුවෙන් බදු එකතුකරගත් බවට වාර්තාගතවූ ආදායම් මත පිහිටා ගණනයකර ඇත.

## වගකිවයුත්තේ කවුද සහ වන්දි ගෙන්වන්නේ කවුද?

ඉමහත් නොසැලකිල්ල හේතුවෙන් රජයට සිදු වූ පාඩුවෙහි වගකීම දරන්නේ කවුද? සුරා බදු පැනවීම සහ ඒවා නියමිත ආකාරයෙන් පවත්වා ගෙන යාමේ වගකීම ශ්‍රී ලංකාවේ වඩාත්ම බලවත් නිලතන්ත්‍රය විසින් පාලනය කෙරෙනු ලබන මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට පැවරෙයි. බදු වෙනස් වීම්වල අක්‍රමවත්භාවය 2 වන ප්‍රදර්ශකය මගින් දුම්වැටි බදු අනුපාතයන්ගේ **විචලනයන්** මගින් පෙන්වනු ලබයි.

**2 වන ප්‍රදර්ශකය: දුම්වැටි සඳහා අයකරන සුරාබදු වල වෙනස්වීම**




විශේෂයෙන්ම පසුගිය වසර පහක කාලය තුළ රජය ආදායම සම්බන්ධ විශාල අර්බුධයකට මුහුණ දී සිටි අතර එය 13.9% දළ දේශීය නිෂ්පාදිතයක් දක්වා අඩු විය. ආදායම අඩු කිරීම වියදම් අඩු කිරීමට හේතු වූ අතර, සෑම අවස්ථාවකම කප්පාදුවට ලක් වූයේ සමාජ ශුභ සාධනය සඳහා උපකාරී වන වියදම්ය. උදාහරණයක් ලෙස, 2013 වර්ෂයේදී රජය විසින් කෘෂිකර්මාන්තයට අයවැයෙන් වෙන්කර තිබූ ප්‍රතිපාදන 40% කින් කප්පාදු කිරීම සිදුකරන ලදී.

සුරා බදු නිසිආකාරව පැනවීමට නොහැකි වීම නිසා වසරකට බිලියන 9.5 ක් ලෙස සිදු වූ පාඩුව වසරක සමෘද්ධි වියදමට සමානය. සමෘද්ධිය, ශ්‍රී ලංකාවේ පවුල්වලින් 30% කට සහය වන්නාවූ රජයේ ශුභ සාධන වැඩපිළිවෙලයි. එයින් අදහස් වන්නේ, පසුගිය වසර 8 තුළ සුරා බදු සඳහා නිසි ආකාර අවධානයක් යොමු කිරීම පමණක් සිදු කළේ නම්, සමෘද්ධි ගෙවීම් දෙගුණ කිරීමේ හැකියාව තිබූ බවයි.

**යහපාලනය දේශපාලකයින් සඳහා පමණක් නොවෙයි**

යහපාලනයේ කොඳුනාරටිය වන්නේ යහපත් දේශපාලකයන් නොව වෘත්තීය නිලධාරීන්ය. නිලධාරින් අත්‍යවශයෙන්ම දේශපාලන දුර්වර්යාවේ වින්දිතයන් නොවන අතර, එහි අතවැසියන්ද විය හැකිය. ඒ අනුව, නිලධාරීන් විසින් වගකිවයුතු ව්‍යුහයක් නිර්මාණය කිරීම වැදගත් වෙයි. ඒ අනුව මෙම විග්‍රහය මගින්, දුම්වැටි බදු සම්බන්ධව අනුගමනය කරනු ලැබූ නිලධාරී අභිමතය සහ වෘත්තීය නොසැළකිලිමත්

භාවය විසින්, වෘත්තීය නොවන තීරණ ගැනීමටත් ඒ හරහා සමාජ ශුභ සාධනය සහ ආදයාමට සිදු වූ පාඩුවත් පෙන්වනු ලබයි.